# සිරිධම්ම විද්‍යාලය
# SIRIDHAMMA COLLEGE

## 7 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පැවරුම 1

## I පත්‍රය

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*
- *දී ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.*

---

1. බුදුන් වහන්සේ පස්වන සතිය ගතකළ ස්ථානය නම්,
   I. කිරිපලු නුගරුක මුල
   II. අජපාල නුගරුක මුල
   III. මිදෙල්ල ගස මුල
   IV. ජයශ්‍රී මහා බෝධිය මුල

2. බුදුන් දහම් සරණ ගිය ප්‍රථම ද්වෛවාචික උපාසකවරු වන්නේ,
   I. උපතිස්ස හා කෝලිත
   II. තපස්සු භල්ලුක
   III. නදී කාශ්‍යප හා ගයා කාශ්‍යප
   IV. සැරියුත් මුගලන් දෙනම

3. බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ඕවාද ප්‍රාති මෝක්ෂය දේශනා කරන ලද්දේ,
   I. බුද්ධත්වයෙන් සිව් වසරකට පසුවය
   II. බුද්ධත්වයෙන් වසරකට පසුව
   III. බුද්ධත්වයෙන් වසර පහකට පසුව
   IV. බුද්ධත්වයෙන් මාස පහකට පසුව

4. තුන් සූත්‍රයට අයත් සූත්‍ර දේශනාවක් වන්නේ,
   I. මහා මංගල සූත්‍රය,සිඟාලෝවාද සූත්‍රය,රතන සූත්‍රය
   II. මහා මංගල සූත්‍රය,රතන සූත්‍රය,කරණීය මෙත්ත සූත්‍රය
   III. දම්සක් පැවතුම් සූත්‍රය,රතන සූත්‍රය,අණාන සූත්‍රය
   IV. මහා මංගල සූත්‍රය,රතන සූත්‍රය,දම්සක් පැවතුම් සූත්‍රය

5. නිත්‍ය සීලය,ගෘහස්ථ සීලය යන නම් වලින් හැඳින්වෙන්නේ
   I. පංච සීලය
   II. දස සීලය
   III. අෂ්ටාංග සීලය
   IV. කෝටියක් සංවර සීලය

6. සිරිත් මල්දම නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
   I. වීදගම මෛත්‍රී හිමි
   II. ඇම්.ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා
   III. වෑත්තෑවේ හිමි
   IV. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

7. කරණීය මෙත්ත සූත්‍රයෙහි ඇතුළත් මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග ගණන,
   I. 12 කි
   II. 15 කි
   III. 8 කි
   IV. 24 කි

8. “ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ” යන කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ?
   I. ලෝවැඩ සඟරාව
   II. සිරිත් මල්දම
   III. ලෝකෝපකාරය
   IV. සුභාෂිතය

9. දුරුතු මස පුර පසළොස්වක පොහෝ දිනක බුදු රජාණන් වහන්සේ ලක්දිවට වැඩම කළ ස්ථානය වන්නේ,
   I. දිවාගුහාව
   II. නාගදීපය
   III. මහියංගනය
   IV. කැළණිය

10. බිම්බිසාර රජතුමා විසින් බුදු සසුනට පූජාකළ ආරාමය වූයේ,
    I. වේළුවනාරාමය
    II. ජේතවනාරාමය
    III. ඝෝසිතාරමය
    IV. නිග්‍රෝධාරාමය

11. ධම්ම පදය නම් කෘතිය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,
    I. ඛුද්දක නිකායට
    II. දීඝ නිකායට
    III. සංයුක්ත නිකායට
    IV. අංගුත්තර නිකායට

12. බුද්ධ රත්නයේ ගුණ ගණන,
    I. 06 කි
    II. 09 කි
    III. 08 කි
    IV. 24 කි

13. කරණීය මෙත්ත සූත්‍රයෙහි "රස්ස" යනුවෙන් දක්වා ඇති සත්වයන් වන්නේ,
    I. දුර වසන සත්වයෝ
    II. ඇසට පෙනෙන සත්වයෝ
    III. ළඟ වෙසෙන සත්වයෝ
    IV. මිටි ශරීර ඇති සත්වයෝ

14. බිම්බිසාර රජුගෙන් පිං බලාපොරොත්තු වූ ඥාති ප්‍රේත පිරිස නිමිති කොට පිං අනුමෝදන් කිරීමේ වැදගත් ක්‍රම පෙන්වා දෙමින් දේශනා කළේ,
    I. මහා ධර්මපාල ජාතකය
    II. තිරෝකුඩ්ඩ සූත්‍රය
    III. ආදිත්ත පරියාය සූත්‍රය
    IV. අනත්ත ලක්ඛණ සූත්‍රය

15. අත්සුණු හා මී පිඬු බුදුරදුන්ට පූජා කරනු ලැබුවේ,
    I. උපතිස්ස කෝලිත දෙදෙනා
    II. තපස්සු භල්ලුක දෙදෙනා
    III. විමල සුබාහු දෙදෙනා
    IV. උරුවෙල හා නදී කාශ්‍යප දෙදෙනා

16. බුදුන් වහන්සේ සියලු කෙලෙසුන් නසා තුන්ලොව පිළිබඳව මනා කොට දැන නොදන්නාවූ ලෝක ප්‍රජාවට ඉතා පැහැදිලි ලෙස දේශනා කළ නිසා,
    I. ලෝකවිදූ නම් වේ
    II. අරහං නම් වේ
    III. සුගත නම් වේ
    IV. සම්මා සම්බුද්ධ නම් වේ

17. පෙර භවයක කළ අකුසලයක් නිසා දරුණු කුෂ්ඨ රෝගයකට ගොදුරු වෙමින් සිටියදී බුදුන් වහන්සේගේ මහා කරුණාවට ලක්වූයේ,
    I. රජ්ජු මාලා ය
    II. පූතිගත්තතිස්ස හිමි
    III. සැවැත්නුවර මහලු පියා
    IV. සැරියුත් හිමි

18. පෙර කළ පිනෙන් පංච කල්‍යාණයෙන් යුක්තව ඉපදුණේ,
    I. යසෝදරා දේවිය
    II. විශාඛා සිටුදේවිය
    III. පටාචාරා
    IV. කිසාගෝතමී ය

19. මිගාර මාතා නමින් ප්‍රසිද්ධ වූයේ,
    I. සුජාතා සිටුදේවිය
    II. මහා ප්‍රජාපතී
    III. කිසාගෝතමිය
    IV. විශාඛා සිටුදේවිය

20. බෝසතාණන් වහන්සේ උපන් දිනයේම උපත ලැබුවෙකි
    I. කාළුදායි ඇමති
    II. අජාසත් කුමාරයා
    III. නන්ද කුමාරයා
    IV. දේවදත්ත කුමාරයා

# II පත්‍රය

❖ *ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.*

---

01.

I. සත් සතියේ සිව්වන සතියේදී සිදුවූ විශේෂ සිදුවීම් මොනවාද?
II. නිවසේ දී අනුගමනය කළයුතු සිරිත් විරිත් දෙක බැගින් ලියන්න.
III. “බව කතරින් එතර” යන කවිය සම්පූර්ණ කරන්න.
IV. ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස බුදුන් වහන්සේට ආරාධනා කළේ කවුරුන්ද?
V. තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාවන් දෙදෙනා නම් කරන්න.

02.

I. බුදුන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා 2 ක් ලියන්න.
II. ඔබට අසරණයන්ට පිහිටවිය හැකි අවස්ථා 3 ක් නම් කරන්න.
III. උපස්ථායකු තුළ තිබිය යුතු ගුණාංග නම් කරන්න.

03.

I. වෛරය සංසිඳෙන අයුරු කියවෙන ඔබේ පෙළ පොතේ ඇතුළත් ධම්මපද ගාථාව ලියන්න.
II. එහි තේරුම ලියන්න.
III. මෙම ධම්මපද ගාථාවෙන් ඔබ ජීවිතයට එක්කර ගත හැකි ආදර්ශ ලියන්න.

04.

I. ත්‍රිවිධ රත්නය නම් කරන්න.
II. බුදු ගුණ නම් කරන්න.
III. බුදු ගුණ භාවනාව වඩන අයුරු පියවර වශයෙන් ලියන්න.

05.

I. බුදු සසුනේ අග්‍රදායිකාව හා අග්‍ර දායකයා නම් කරන්න.
II. අනේ පිඬු සිටුතුමාගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න.
III. ධනංජය සිටුතුමා විශාඛාවට යුගදිවිය සාර්ථක කරගැනීමට ලබා දුන් උපදේශ 5 ක් ලියන්න.